**ශීර්ෂය 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

**---------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2023 දෙසැම්බර් 31 දිනට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 හි 05 ප්‍රකාරව නොයෙකුත් සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු කාලානුරූපව සංශෝධනය කළ යුතු වුවද දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ නිවාස 75 න් නිවාස 59 ක් 2007 වර්ෂයේ තීරණය කරන ලද මිල ගණන් පදනම් කර ගෙන ආයතනයේ නිලධාරීන් සඳහා කුලියට ලබා දී තිබුණි. එම චක්‍රලේඛයේ 07 ප්‍රකාරව අර්ධ වාර්ෂික ආදායම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මේවා ඉතාම පැරණි මෙන්ම අවම පහසුකම් වලින් සමන්විත ගොඩනැගිලි බව කාරුණිකව පෙන්වාදෙමි. ඒ අනුව අදාල තක්සේරු කුලිය සංශෝධනය කර දෙන ලෙස ඉල්ලමින් 2024 පෙබරවාරි 09 දින බදුල්ල තක්සේරු දෙපාර්තමේන්තුවට ලිපියක් යොමු කර ඇත. ඉදිරියේදී නිවාස කුලිය සංශෝධනය කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදි. අර්ධ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොමැති බව පිළිගනිමි.2024 වර්ෂයේ දී විධිමත් පරිදි ආකෘති අංක 02 ප්‍රකාරව කාර්ය සාධනය වාර්තා කල යුතු බව නිලධාරීන් වෙත උපදෙස් ලබාදෙන ලදී. | ගාස්තු කාලානුරූපව සංශෝධනය කළ යුතු අතර ආදායම් වාර්තාද කාලානුරූපව ඉදිරිපත් කළ යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වාර්ෂික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා තිබුණු එකතුව රු. 300,000,000 ක් වූ වැය විෂයන් 2 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | සමෝධානික ඉඩම් තොරතුරු පද්ධතිය සකස් කිරීම සඳහා දේශීය අරමුදල් වලින් රු. 20,000,000 ක්ද විදේශ අරමුදල් වලින් රු. 280,000,000 ක්ද ලෙස එකතුව රු. 300,000,000 ක ප්‍රතිපාදන ව්‍යාපෘතියේ වැඩ කටයුතු සිදු නොකරන ලද බැවින් වියදම් කළ නොහැකිව ඉතිරිව පැවැතිණි. | ප්‍රතිපාදන ඉල්ලීමේදි වර්ෂය තුළ ඉටුකළ හැකි වැඩසටහන් වලට සීමා කරගත යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | මු. රෙ. 104(3) සහ 104(4) | - | පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින හතකට වැඩි ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාව වහාම එවිය යුතු බවට සඳහන් වුවත් එම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථා 04 කදී දින 45 ත් 66 ත් අතර කාල පරාසයක් ගතවී තිබුණි. පරීක්ෂණයෙන් පසු, අලාභහානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාව ඉදිරිපත් කළ යුතු බවට දක්වා තිබුණ ද එම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථා 04 කදී දින 08 ත් 86 ත් අතර කාල පරාසයක් ගතවී තිබුණි. | ආයතනික ව්‍යුහය අනුව ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාලය, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය හා ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයන් ස්ථර 4ක් ඔස්සේ ක්‍රියාත්මක සහ සීමිත කාර්යය මණ්ඩලය මඟින් අදාළ කටයුතු කළමනාකරණය කර ගැනීමට සිදුවීම හේතුවෙන්, ප්‍රායෝගික ප්‍රමාදයන් සිදුවීම. | අදාල වාර්තා නිසි වෙලාවට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය මගින් සංශෝධිත මු.රෙ.113(6) (ආ) | 4,489,849 | චක්‍රලේඛයට පටහැනිව ක්‍රියාකිරීම නිසා දෙපාර්තමේන්තුවේ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 93 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 4,489,849 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබූ අතර | චක්‍රලේඛ ප්‍රකාරව අදාළ ණය ශේෂය අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුය. |

ඉන් රු. 1,183,086 හෙවත් සියයට 26 ක් වර්ෂ 20 වැඩි කාල පරාසයකට අයත් ඒවා විය.

## 2.4 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියාකළ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතෙහි 21 වන වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂයේ බදු කාල පරිච්ඡේද සඳහා නියමිත දිනයේ දී එකතු කළ අගය මත බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර නොතිබූ අතර ප්‍රමාද කාලය මාස 03 සිට දින 03 දක්වා වූ කාල පරාසයක විය. 2023 වර්ෂයේ අවසන් කාර්තුවේ වාර්තාව 2024 මැයි 20 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ පළාත් කාර්යාල මගින් එකතු කළ අගය මත බදු වාර්තා ගෙන්වා ගැනීමේදී සිදුවූ ප්‍රමාදයන් ද ඒවා වැරදි නිවැරදි කර ගැනීමේදී හා නැවත සකස් කිරීමේදී ඇතිවූ ගැටලු නිසාද විය. ඉදිරියේදී වාර්තා කඩිනමින් ගෙන්වා නියමිත දිනයට පෙර බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. | නියමිත දිනයේ බදු වාර්තා ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු (2006 අංක 8 දරන එකතු කළ අගය මත බදු පනතින් සංශෝධිත) පනතෙහි 26 වන වගන්තිය ප්‍රකාරව යම් බදු අයකළහැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වූ බද්ද එම බදු අයකළ හැකි කාලසීමාවේ අවසානයෙන් පසුව එළඹෙන මාසයේ විසි වන දිනට පසු දිනයක් නොවන දිනයක ගෙවිය යුතු බව සඳහන් වුවද රු. 16,626,594 ක් වූ එකතුකළ අගය මත බදු දින 02 ත් 26 අතර කාල ප්‍රමාදයකින් පසුව ගෙවා තිබුණි. | මාසික එකතු කළ අගය මත බදු මුදල් ලැබීම එක ගිණුමක් හරහා ගිණුම් ගත කිරීම (**Online Payment Gateway**) නිසා සැසඳීමේ අපහසුතාවය නිසා තොරතුරු ලබා ගැනීම ප්‍රමාද වූ බැවිනි. ඉදිරියේදී ඒ සඳහා පළාත් වශයෙන් වෙන වෙනම ගිණුම් ආරම්භ කොට ගිණුම් කටයුතු සිදු කිරීමට සැලසුම් කරන බැවින්, මෙම ගැටලුව ඉදිරියේදී විසඳා ගත හැකි වන බව කාරුණිකව දන්වා සිටිමි. | බදු පනත ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | 2023 පළමු කාර්තුවෙහි එකතු කළ අගය මත බදු වාර්තාව අනුව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට රු. 9,148,168 ක් ගෙවිය යුතු වුවද, පළමු කාර්තුව සඳහා රු. 9,258,513 ක් ගෙවා තිබූ අතර ඒ අනුව රු. 110,345 ක් වැඩියෙන් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | 2023 පළමු කාර්තුවෙහි එකතු කළ අගය මත බදු වාර්තාවට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර ඇති වටිනාකමේ වෙනසක් ඇති බව පිලිගනිමි. මේ පිළිබඳව සාකච්ඡා කොට වැඩිපුර ප්‍රේෂණ වටිනාකම ඉදිරි මාස තුළදී එකතු කල අගය මත බදු සඳහා ගෙවිය යුතු වටිනාකමින් හිලව් කරගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | බදු නිවැරදිව ගණනය කර ප්‍රේෂණය කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරුන් විවිධ මැනුම් වර්ග සිදු කරන අතර ඉන් මායිම් ගල් දමා ව්‍යවස්ථාපිත හේතූන් මත සිදු කරන මැනුම් සඳහා මාසික ඉලක්කය ඉඩම් කට්ටි 20ක් වන අතර ඉඩම් කැබලි නම් 30 ක් ලෙස වර්ෂ 16 කට පෙර පිහිටුවාගත් සම්මතය (Norms), මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමග වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය කර නොතිබුණි. | මාසික වැඩ ප්‍රමාණයන් සමාලෝචනය කර සංශෝධනයෙන් පසු වාර්තාව ඉඩම් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලද පසු අදාල මාසික වැඩ ප්‍රමාණයන් සංශෝධනය කිරීමට ක්‍රියා කරනු ඇත. | සම්මතයන් (Norms), මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමග වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය කළ යුතුය. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂවල සිට 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මැනුම් වර්ග 08 ක් යටතේ ලැබී ඇති මුළු මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව 129,270 කින් නිම කළ සංඛ්‍යාව 95,933 ක් වූ අතර එදිනට නිම නොකළ සංඛ්‍යාව 33,337 ක් හෙවත් සියයට 26 ක් විය. එම මැනුම් ඉල්ලීම් අතර වර්ෂ 4ට වැඩි මැනුම් ඉල්ලීම් 8,688 ක්ද, වර්ෂ 3 ට වැඩි මැනුම් ඉල්ලීම් 3,834 ක් ද, වර්ෂ 2 ට වැඩි මැනුම් ඉල්ලීම් 4,712 ක් ද, වර්ෂ 1ට වැඩි මැනුම් ඉල්ලීම් 6,276 ක් ද විය. | නිම නොකළ මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව වන 33,337 වරින් වර උච්ඡාවචනය වේ. ඉල්ලීම් ලැබෙන සීඝ්‍රතාවය මත, භූමියේ මතුවන ඉඩම් ආරවුල්වල ස්වභාවයන් මත සහ ක්ෂේත්‍රයේ කටයුතු කරන රජයේ මිනින්දෝරුවරුන්ගේ සීමිත සංඛ්‍යාව නිසාද ක්‍රියා නොකළ මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව ඉහළ යාම සිදුවේ. | මැනුම් ඉල්ලීම් ඉටුකිරීමේ කාර්යක්ෂමතාවය වැඩිකළ යුතුය. |
| (ආ) | කොළඹ දිස්ත්‍රික් කාර්යාලය | | |
| | (i) කොළඹ දිස්ත්‍රික් කාර්යාලයට අදාළව මැනුම් ඉල්ලීම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (SRIMS) හා මැනුම් ගාස්තු ලේඛණය පරීක්ෂාවේදී ආයතන 16 කින් මැනුම් කටයුතු සඳහා ගාස්තු ලෙස රු. 1,187,085 ක් අය වී 2020 වර්ෂයේ සිට 2023 ඔක්තෝබර් 31 දිනට දින 195 සිට දින 1338 දක්වා වූ | රු.1,187,085ක් වෙනුවෙන් වූ ඉල්ලීම් 16 හි අංක සඳහන්ව නොතිබූ බැවින් වෙන් වශයෙන් කුමන ඉල්ලීම්ද යන්න හඳුනාගත නොහැක. මැනුම් ඉල්ලීමේ සඳහන් කර ඇති තොරතුරු මත පමණක් පදනම්ව ගාස්තු ගණනය කරනු ඇත. ක්ෂේත්‍ර වැඩ ආරම්භ කිරීමෙන් පසු ක්ෂේත්‍රයේ ඇතිවන මායිම් ගැටලු, සහ විවිධාකාර ආරවුල් අනුව කල්ගත වීමට හැකියාවක් පවතී.රටේ | ලැබෙන මැනුම් ඉල්ලීම් ප්‍රමුඛතාවය අනුව කඩිනමින් ඉටු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාල පරාසයක් ගත වී ඇතත් අදාළ මැනුම් කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. | පවත්නා වඩා සංවේදී හා ප්‍රමුඛතාවය දිය යුතු කාර්යභාරය ප්‍රථමයෙන් නිම කළයුතු බැවින් අඩු ප්‍රමුඛතාවයන් සහිත ඉල්ලීම් ක්‍රියාත්මක කිරීමට යම් කාලයක් ගත වනු ඇත. | |
| (ii) | මැනුම් ඉල්ලීම් තොරතුරු කළමනාකරණ පද්ධතියේ සඳහන් කර තිබුණු මැනුම් ඉල්ලීම් 05 ක් අදාළ මිනින්දෝරුවරයෙකු වෙත පැවරීම සඳහා දින 66 සිට දින 490 දක්වා වූ කාල පමාවක් සිදුව තිබුණි. | මැනුම් ඉල්ලීමට අංකයක් යොදා තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතියේ ඇතුළත් කර අදාළ කාර්යාලයට නිකුත් කරනු ලැබේ. උසාවි මැනුම් ඉල්ලීම් වැනි ඉහළ ප්‍රමුඛතාවයක් අවශ්‍ය මැනුම් ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු බැවින් මෙම මැනුම් ඉල්ලීම් ප්‍රමාද වීම සිදු වේ. එබැවින් ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය වෙත දිස්ත්‍රික් මිනින්දොරු කාර්යාලයෙන් මැනුම් ඉල්ලීම් ලැබුණද රජයේ මිනින්දෝරුවරුන් වෙත නිකුත් කිරීමට කාල පරාසයක් ගත වනු ඇත. එය අදාල මැනුම් ඉල්ලීමේ ප්‍රමුඛතාවය මත තීරණය වනු ඇත. | මැනුම් ඉල්ලීම් ඉටු කිරීමේ කාලය හා ප්‍රගතිය පරික්ෂා කළ යුතුය. |
| (iii) | 2022 මාර්තු මස 29 දින තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි පාසල් 10 ක ඉඩම් මැනීම සඳහා ඉල්ලීම් ලැබී තිබූ අතර ඒ අනුව ශාන්ත මැතිව් විද්‍යාලයේ ඉඩම් මැනුම් වැඩ කටයුතු අවසන් කර අදාළ පිඹුර 2023 අප්‍රේල් 19 දින කලාප අධ්‍යාපන කාර්යාලය වෙත යවා තිබුණි. ඒ අනුව මැනුම් ඉල්ලීම කළ දිනයේ සිට දින 386 ක හෙවත් වර්ෂයකට වැඩි කාලයක ප්‍රමාදයකින් මැනුම් ඉල්ලීම් අවසන් කර තිබුණි. | දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අදාළ මැනුම් ඉල්ලීම්වල ක්ෂේත්‍ර කටයුතු දිස්ත්‍රික්ක තුළ මිනින්දෝරු මහතුන්ගෙන් ආවරණය කරගත නොහැකි අවස්ථාවලදී ප්‍රමුඛත්වය ලබාදෙන මැනුම් කටයුතු විශේෂ මැනුම් ඒකකය ලවාද ඉටුකර ගන්නා අවස්ථා ඇත.මෙම මැනුම් ඉල්ලීම සම්බන්ධයෙන් පාසලේ විදුහල්පතිවරයා ඉල්ලීම් කර ඇති බැවින් මෙයද විශේෂ මැනුම් ඒකකය ලවා ඉටු කරවාගෙන ඇත. | මැනුම් ඉල්ලීම් අප්‍රමාදව ඉටුකල යුතුය. |
| (ඇ) | මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය විසින් මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් සඳහා පවත්වනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදීම (NVQ මට්ටම 2) සඳහා වූ පාඨමාලාව 2023 වර්ෂයේදී පවත්වා නොතිබුණි. | 2023 වසරේ මැනුම් කටයුතු සඳහා වන දැ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවට අදාල අනුමැතිය ලැබී නොතිබුණු බැවින් එම පාඨමාලාව ඇරඹී නැත.නමුත් ක්ෂේත්‍ර මැනුම් සහායකයින්ට 2022 වසරේ බඳවා ගත් සුදුසුකම් සහිත පුද්ගලයන් සඳහා 2023 වර්ෂයේ ජාතික වෘත්තීය සුදුසුකම් ලබා දීමේ පාඨමාලාව NVQ 2/3 පවත්වන ලදී. | අනුමත පාඨමාල නිසි ලෙස පැවත්විය යුතුය. |

## 3.3 විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදේශ ණය අපේක්ෂාවෙන්, විදේශ සම්පත් දෙපාර්තමේන්තු හා ඉඩම් අමාත්‍යාංශ අනුමැතිය ලැබුණු පසු, ණය අරමුදල් ලබා ගැනීම සඳහා ණය ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර, අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වා ඇතත් 2023 වසරේ රජයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදාමයෙහි ප්‍රතිඵලයක් ලෙස දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා ඉඩම් තොරතුරු සේවා පද්ධති ව්‍යාපෘතිය කිසිදු ප්‍රගතියක් ලබා කරගෙන නොතිබුණි. මෙම ව්‍යාපෘතියට අදාලව මූලික කාර්යයන් කිසිවක් සිදු නොකර 2022 හා 2023 යන වර්ෂ තුළදී අයවැය තුළින් ප්‍රතිපාදන වෙන් කරවා ගෙන තිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේ දී ව්‍යාපෘති වාර්තාව සකස් කර 2022 වසර මුල සිට ව්‍යාපෘති ආරම්භ කිරීමට සූදානම්ව සිටියද අදාළ විදේශ ණය අරමුදල් අනුමත නොවූ බැවින් 2023 වර්ෂයේ දී කිසිදු ප්‍රගතියක් සිදු නොවුණි. එසේම 2022 හා 2023 වර්ෂවල අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කරවා ගත්තද විදේශ ණය අරමුදල් සඳහා අනුමැතිය නොලැබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ කිසිදු කාර්යයක් සිදු කිරීමට නොහැකි වූ බව කාරුණිකව දන්වා සිටිමි. | ඉටු කිරීමට අපේක්ෂිත කාර්යය සඳහා පමණක් ප්‍රතිපාදන වෙන්කර ගත යුතුයි. |

## 3.4 ප්‍රසම්පාදනයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර එහි 4.2.1 (ආ) ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක (03) කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත් එවැනි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉදිරි වර්ෂ 03 ක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුව ක්‍රියාකළ යුතුය. |
| (ආ) | ආරක්ෂක සේවා කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ දී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 වගන්තිය අනුව ලංසු විවෘත කිරීම නියමිත ආකෘති පත්‍රයට අනුව වාර්තා කළ යුතු වුවත්, නියමිත ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමේදී Yes ලෙස සටහන් කළ යුතු අවස්ථාවලදී "Y" ලෙසද, No ලෙස සටහන් කළ යුතු අවස්ථාවලදී "N" ලෙසද දක්වන ලෙස උපදෙස් දී තිබුණද ඒ වෙනුවට √ සහ X යොදා තිබුණි. | ඉදිරියේ දී එම ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමේදී Yes ලෙස සටහන් කළ අවස්ථාවලදී "Y"ලෙසද, No ලෙස සටහන් කළ යුතු අවස්ථාවලදී "N" ලෙසද සටහන් කරන ලෙස ලංසු විවෘත කිරීමේ කමිටුවට දැන්වූ බව කාරුණිකව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය නොවන වත්කම්වලට අදාළව 2022 මූල්‍ය ප්‍රකාශනවල SA – 82 ආකෘතියෙහි දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය ලෙස දක්වා තිබූ වටිනාකමට වඩා වැඩියෙන් රු.13,847,422 ක් 2023 මූල්‍ය ප්‍රකාශනවල SA – 82 ආකෘතියෙහි ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස දක්වා තිබුණි. | SA 82 වාර්තාව සඳහා අවශ්‍ය සැසඳීම් කටයුතු මේ වන විට සිදුකරගෙන යනු ලබයි. අවසන් ගිණුම් සකස් කිරීමේදී ආරම්භක ශේෂය ලෙස ගත යුතු නිවැරදි අගය වන රු.10,600,869,259 මූල්‍යමය වටිනාකම අනුව 2023 වර්ෂයේ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශණය සකස් කර ඇති අතර, ඊට ගැලපෙන පරිදි නිවැරදි කිරීම ඉදිරියේදී සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ භාණ්ඩාගාර වාර්තා සමග සමාන විය යුතුය. |
| (ආ) | SA – 82 ආකෘතියෙහි 2023 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය නොවන වත්කම්වල එකතුව රු.11,088,124,680 ක් වුවත් එදිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි අගය රු.11,074,119,758 ක් වූයෙන් වෙනස රු. 14,004,922 ක් විය. මෙම වෙනස හඳුනාගෙන භාණ්ඩාගාර පොත් හා නිවැරදි කර නොතිබුණි. | මෙහි සඳහන් වෙනස වන රු.14,004,922 ක මුදල ගිණුම්ගත කර ඇත්තේ 992 ශීර්ෂය යටතේ භාණ්ඩාගාරය විසින් වන අතර, ඔවුන්ගේ ගිණුම් නිරවුල් කිරීම සඳහා මෙම අගය ඇතුළත් කර ඇති බව භාණ්ඩාගාර ගිණුම් දෙපාර්තමේන්තුව විමසීමේදී වාචිකව දන්වන ලදී. අදාළ ගිණුම්ගත කිරීම භාණ්ඩාගාරය විසින් කර ඇති බව 2023 වර්ෂයේ SA 81 වාර්තාවෙන් පැහැදිලි වේ. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ භාණ්ඩාගාර වාර්තා සමග සමාන විය යුතුය. |
| (ඇ) | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ සඳහා එකතුව ලෙස රු.9,725,619 ක් වැයකර ඇතත් SA – 82 ආකෘතියෙහි එම මිලදී ගැනීම් රු. 8,641,788 ක් ලෙස දැක්වීම නිසා රු. 1,083,831 ක වෙනසක් පැවතිණි. | අදාළ උප කාර්යාල මගින් ගිණුම්ගත කිරීමේදී ආරම්භක ශේෂය වැඩිවීමක් ලෙස ගිණුම්ගත කර ඇත. ඒ නිසා මිලදී ගැනීම් සියල්ල ගිණුම්ගත නොවූ ලෙස බැලූ බැල්මට පෙනුන ද, සියලු මිලදී ගැනීම් වත්කම් අගයට එකතු වී ඇත. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවල ශේෂ භාණ්ඩාගාර වාර්තා සමග සමාන විය යුතුය. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ පිහිටි ගල්හට් 08 ක් හා නිවාස 07 ක් උපයෝජනයකින් තොරව පැවති අතර එක් නිවසක් අලුත්වැඩියා කර උපයෝජනය කළයුතු මට්ටමක පැවතිණි. | නිල නිවාස ඉල්ලුම් කර තිබූ සියලුම නිලධාරීන්ට සහ ශිෂ්‍යයින්ට 2023 දෙසැම්බර් මාසය වන විට පදිංචිය සඳහා නිල නිවාස ලබා දී තිබුණි. 2023 දෙසැම්බර් මාසය වන විට නිල නිවාස 16 ක් උපයෝජනයකින් තොරව පැවතිණි. කෙටි දැනුම්දීමකින් සිදුවන නිලධාරීන් බඳවා ගැනීමකදී ඔවුන්ගේ භාවිතයට ලබාදීම සඳහා මෙම නිවාස දැනට හිස්ව පවතී. නිවාස 08 ක් 2024 වර්ෂයේ දී නිලධාරීන් වෙත ලබාදී ඇත. | සම්පත් නිසි ලෙස උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පොත්වලින් කපා හැරීම් පිළිබඳ ප්‍රකාශනයෙහි කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය ලෙස අයිතම 03 කට අදාළව රු. 962,275 ක් දක්වා තිබූ අතර 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ එම අයිතම 03ට අදාළව ආරම්භක කපා නොහළ ශේෂය ලෙස රු. 1,046,100 ක් ලෙස දැක්වීම නිසා එම ශේෂය රු. 83,825 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව සකසන ලද වාර්තාව මේ සමඟ අමුණා එවමි. | මූල්‍ය ප්‍රකාශනයෙහි නිවැරදි ශේෂයන් දැක්විය යුතුය. |

## 3.6 කළමනාකරණ දූර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 මැයි 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2021(viii) පරිදි පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතු බව දක්වා ඇතත්, වැලිමඩ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ඇති ඇඟිළි සලකුණු යන්ත්‍රය 2022 ජනවාරි 12 දින සිට ක්‍රියා විරහිතවීම හේතුවෙන් මෙම වාර්තාවේ දින වන විටත් එම යන්ත්‍රය අළුත්වැඩියා කර නොතිබුණි. | ඉදිරියේදී ඇඟිලි සලකුණු යන්ත්‍රය අළුත්වැඩියාවෙන් පසු හෝ නව යන්ත්‍ර සවිකිරීමෙන් පසු මෙම ගැටලුව නිරාකරණය වනු ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව කාර්ය මණ්ඩලයේ පැමිණීම හා නිවාඩු සලකුණු කිරීම ඇඟිළි සලකුණු යන්ත්‍රය භාවිතයෙන් සිදුකල යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ මැනුම් ඉල්ලීම් ලැබුණු දිනයේ සිට එහි වැඩ කටයුතු අවසන් වන තෙක් සම්පූර්ණ අදියරයන් පිළිබඳ විස්තර එකවර මැනුම් ඉල්ලීම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (SRIMS) හරහා ලබාගැනීමට පද්ධතියේ අතුරු මුහුණත් (Interfaces) කීපයකට ඇතුල්වී සංකීර්ණ ක්‍රියාවලියක් තුළින් තොරතුරු ලබාගත යුතුව තිබුණි. | මැනුම් ඉල්ලීමක වර්තමාන තත්ත්වය Requisition Status Searcher තුළින් එකවර බලාගත හැකිය. කෙසේ වෙතත් තවදුරටත් අවශ්‍ය වන තොරතුරු ඊට ඇතුළත් කිරීමට සටහන් කර ගන්නා ලදී. | කළමණාකරනය ට අවශ්‍ය සියලුම තොරතුරු ලබාගත හැකි අකාරයට මැනුම් ඉල්ලීම් තොරතුරු කළමනාකරණ පද්ධතිය සකස් විය යුතුයි. |
| (ඇ) | මිනින්දෝරු සේවා ව්‍යවස්ථාව අනුව දෙපාර්තමේන්තුවට ආධුනික මිනින්දෝරුවරුන් බඳවා ගැනීමේදී පවතින පුරප්පාඩු මත නියමිත සුදුසුකම් සහිත උපාධිධාරීන් සියයට 90 ක් විවෘත තරඟකාරි විභාගයකින් ද , තාක්ෂණ නිලධාරීන්ගේ කුසලතාවය මත පදනම්ව ඉතිරි සියයට 10 ද බඳවා ගැනීම සිදුකරයි. උපාධිධාරීන් ලෙස බඳවා ගන්නා සියයට 90 න් 9 : 1 අනුපාතයට | පවතින සේවා ව්‍යවස්ථාව සහ නිලධාරීන්ගේ පුරප්පාඩු ප්‍රමාණය අනුව, රජය මගින් කලින් කලට ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ යටතේ බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. මේ නිසා සමහර වසර වලදී බඳවා ගැනිම් සිදු කිරීමට අවශ්‍යතාවය තිබුණද බඳවා ගැනිම් සිදුකර පුහුණුව සඳහා යෙදවීමට හැකියාවක් නොමැති වී ඇත. පවතින ව්‍යවස්ථාව අනුව මෙම බඳවා ගැනීම් සිදු කරන අතර, රජය | සම්පත් උපරිම ප්‍රයෝජනයක් ලැබෙන පරිදි පාඨමාලා සැලසුම් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මැනුම් විද්‍යා උපාධිදාරීන් හා අනෙකුත් උපාධිදාරීන් බඳවා ගනු ලබයි. එසේ බඳවා ගන්නා අනෙකුත් උපාධිධාරීන් හා මැනුම් විද්‍යා උපාධිය හැදෑරීමට තරඟකාරී විභාගයකින් තෝරා ගන්නා තාක්ෂණ නිලධාරීන්ගෙන් කිසියම් ප්‍රමාණයක් උපාධි පාඨමාලාව හැදෑරීමට බඳවා ගන්නා බැවින් 2022 සිට 2026 දක්වා වර්ෂ 4 ක පාඨමාලාව සඳහා සිසුන් 22 ක් වැනි ඉතා අඩු සිසුන් ප්‍රමාණයක් විය. ආධුනික මිනින්දෝරුවරුන් බඳවා ගැනීම් නොමැති අවස්ථාවක උපාධි පාඨමාලාව සඳහාද සිසුන් නොමැති තත්වයක් ද නිරීක්ෂණය විය. | මගින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ මත අනුමැතිය ලබා දෙන අවස්ථාවල මෙම උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනිම් සිදු කරනු ලැබේ. | |
| (ඇ) | 2022 - 2026 උපාධි කණ්ඩායමේ සංයුතිය වෙනත් උපාධිධාරීන් 08 ක් හා තාක්ෂණ නිලධාරීන් 14 ක ගෙන් යුක්ත වූ අතර මෙම පාඨමාලාවට තෝරා ගැනීමේ දී අනෙකුත් උපාධිධාරීන් ප්‍රමාණය තීරණය කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් තිබූ අතර තාක්ෂණ නිලධාරීන් තරඟ විභාගයකින් තෝරා ගන්නා බව 2021 ජූලි 02 දිනැති අංක 16/2021 දරන මිනින්දෝරු දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩල චක්‍රලේඛයෙහි සඳහන් වුවද එසේ බඳවා ගනු ලබන ප්‍රමාණය තීරණය කිරීම සඳහා වන නිශ්චිත ක්‍රමවේදයක් හෝ ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය. | අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ඇතුළත් චක්‍රලේඛ ලිපි අංක 16/2021 යටතේ 2021 ජූලි 02 දිනට තීරණය කර ඇති අතර 2021 අගෝස්තු 11 දිනට අයදුම්පත් කැඳවීම අවසන් කර ඇත. 2021 ඔක්තෝබර් 23 පැවති තරඟ විභාගය අනුව සිසුන් 14 දෙනෙකු 2022 ජනවාරි 13 දින සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඔවුන් මෙම උපාධි පාඨමාලාව සඳහා තෝරාගෙන ඇති බව කාරුණිකව දන්වමි. | තාක්ෂණ නිලධාරීන්ගේ ප්‍රමාණය තීරණය සඳහා නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතුය. |
| (ඉ) | මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ දේශන පැවත්වීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 17 ක් ස්ථිර කථිකාචාර්යවරුන් ලෙස පත්කර ඔවුන්ට කථිකාචාර්ය දීමනාවක් තම නිත්‍ය තනතුරේ වැටුපට අමතරව ගෙවා තිබුණි. මින් නිලධාරීන් 15 දෙනකුට පමණක් කථිකාචාර්ය දීමනාව ගෙවා ඇතත් ඉන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සහකාර ජනරාල්(පුහුණු) හා නියෝජ්‍ය සහකාර ජනරාල් (අධ්‍යයන) යන දෙදෙනා පාඨමාලා අධික්ෂණය සිදු කර ඇතත් කිසිඳු දේශනයක් නොපවත්වා තිබූ අතර කථිකාචාර්යවරු තිදෙනකු පන්ති භාර ලෙස සඳහන් කරමින් කිසිඳු දේශනයක් නොපවත්වා දීමනාව ලබා ගෙන තිබුණි. 2023 වර්ෂය මෙම සිසුන්ගේ දෙවන අධ්‍යයන වර්ෂය වන අතර ඒ සඳහා | මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයට උපාධි පාඨමාලාව පැවැත්වීම සඳහා සේවයේ යොදවා ගන්නා සියලුම කථිකාචාර්යවරුන් සහ එම පාඨමාලාව පවත්වා ගැනීම සඳහා සේවය සපයන නිලධාරීන් සඳහා කථිකාචාර්ය දීමනාව ලබා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ආ/8/5/719/272/11 හා 2007 පෙබරවාරි 13 දිනැති ලිපිය මගින් අවසර ලබා දී ඇත. ඒ අනුව BDC පාඨමාලාව පවත්වාගෙන යාම සඳහා අධීක්ෂණ කටයුතු, දේශන පැවැත්වීම සහ පාඨමාලාව මෙහෙයවන පංති භාර නිලධාරීන් සඳහා ගෙවීම් ඒ අනුව සිදු කරයි.එම දේශකවරු කාල සටහනකට දේශන නොපැවැත්වුවද පුහුණුවීම් කාලය තුළ උපදේශනාත්මක | කථිකාචාර්ය දීමනාව ලබා ගන්නා සියලුම ස්ථිර කථිකාචාර්යවරුන් සඳහා දේශන පැය වෙන්කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පැවත්විය යුතු අනුමත දේශන පැය ගණන 1950 ක් වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව දේශන පැය 700 ක් පමණක් පවත්වා තිබුණි. | දේශන පංති කාමර තුළ සිදු කෙරේ. අදාළ දේශන පැය ප්‍රමාණය උපාධිය ලබා දීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත දේශන පැය ප්‍රමාණයට පවත්වාගෙන යාමට කටයුතු කර ඇති අතර, උපදේශන හා සම්බන්ධීකරණ කමිටු රැස්වීම මඟින් උපාධි ප්‍රතිඵල ලබාදීමේදී එය අධීක්ෂණය කරනු ලබයි. | |
| (ඊ) | 2022 සිට 2026 දක්වා වූ සිව් අවුරුදු උපාධි පාඨමාලා සිසුන් 22ක් වෙනුවෙන් අධ්‍යාන කටයුතු කරගෙන යන අතර කෙටි කාලීන පාඨමාලා 17 ක් හා එක්දින වැඩමුළු 51 ක් පමණක් 2023 වර්ෂයේ පවත්වා තිබුණි. මෙම ආයතනය විවිධ ගොඩනැගිලි අංග 121 කින් සමන්විත අක්කර 61 ක භූමිභාගයක් තුළ ඉතා විශාල භෞතික සම්පත් සහිතව පිහිටා ඇතත් ඒවායේ උපයෝජනය ඉතා අඩු මට්ටමක පැවතිණි. | 2022 සිට රටේ උද්ගත වූ ගැටලුකාරී තත්ත්වය මත රජය විසින් අපගේ සේවාව සඳහා සේවයට බඳවා ගන්නා නිලධරයන් බඳවා ගැනීම සීමා කිරීම හේතුවෙන් අධ්‍යාන කටයුතු වල යම් පසුබෑමක් 2021 වර්ෂයේ සිට දක්නට ලැබුණි. ඉදිරියේදී අප ආයතනයේ උපයෝජනය ඉතා ඉහළ මට්ටමකට පත් කිරීම සඳහා කටයුතු සම්පාදනය කරමින් පවතී. | සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගත යුතුය. |
| (උ) | මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ උපාධි සිසුවෙකුගේ ශිෂ්‍ය ඒකක පිරිවැය වෙනුවෙන් මසකට වැයවන අධ්‍යයන හා පරිපාලන වියදම රු.25,426 ක් ද, සිසුන්ගේ 2024 පෙබරවාරි මස සාමාන්‍ය දල වැටුප පදනම් කරගෙන එක් සිසුවෙකුගේ මාසික සාමාන්‍ය වැටුප රු. 55,927 ක් වූයෙන් එක් සිසුවෙකු සඳහා මාසික පිරිවැය රු. 81,353 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව සිව්වසරක උපාධිය (මාස 48) සඳහා එක් සිසුවෙකු වෙනුවෙන් රු. 3,904,944 ක් විය. ආධුනික මිනින්දෝරුවරු බඳවා ගැනීමේදී පුරප්පාඩුවලට වඩා වැඩි පිරිසක් බාහිර අයදුම්කරුවන් සිටින බැවින් මැනුම් විද්‍යා උපාධිධාරීන්ගෙන් හා අනෙකුත් උපාධිධාරීන්ගෙන් පවතින පුරප්පාඩු මත සියයට 90 ක් විවෘත තරඟකාරි විභාගයකින් තෝරා ගනු ලබයි. මෙම ආයතනය 1990 දී විශ්වවිද්‍යාල පනත යටතේ පිළිගන්නා අවස්ථාවේ දී මැනුම් විද්‍යා පිළිබඳ වෙනත් විශ්වවිද්‍යාලයකින් උපාධි ප්‍රදානය නොකලද වර්තමානයේදි සබරගමුව විශ්වවිද්‍යාලය හා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මැනුම් විද්‍යා උපාධිධාරීන් | මැනුම් පනතට අනුව අප දෙපාර්තමේන්තුවේ සේවය සඳහා බඳවා ගන්නා සියලු ආධුනික මිනින්දෝරුවරුන් සඳහා වසර 4 ක මැනුම් විද්‍යාව පිළිබඳ උපාධියක් ලබාගත යුතු වන්නේ උපාධිධාරියා විසින් ලබා ගත් උපාධිය මැනුම් විද්‍යාවට අදාළ නොවන උපාධියක් වූ අවස්ථාවකදී පමණි. එය මැනුම් විද්‍යා උපාධිධාරීන් බඳවා ගැනීමේදී මැනුම් විද්‍යා උපාධිය හදාරන 9 දෙනෙකුට අනෙකුත් උපාධි හදාරන එක් අයෙකු වශයෙනි. ඒ අනුව මැනුම් විද්‍යා උපාධිය සහිතව බඳවාගනු ලබන සබරගමුව හා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල නිලධාරීන් සඳහා මෙම උපාධිය අත්‍යාවශ්‍ය නොවන අතර ඒ නිලධාරීන් සඳහා මාස 06 ක දිශානුගත කිරීමේ පාඨමාලාවක් පවත්වනු ලබයි. මැනුම් පනතට අනුව මැනුම් විද්‍යා උපාධිය රහිත උපාධිධරයෙකුට අප දෙපාර්තමේන්තුවට බැඳීමට ලබා දී ඇති "මැනුම් විද්‍යා උපාධිය තිබිය යුතුයි" යන සුදුසුකම නිසා එම නිලධාරීන් පමණක් අවුරුදු 04 ක මැනුම් විද්‍යා උපාධිය අප ආයතනය තුළ හැදෑරිය යුතු වේ. මෙම නිලධාරීන් විවිධ විෂයන් ඔස්සේ තාක්ෂණික දැනුමින් සන්නද්ධ | මැනුම් විද්‍යා උපාධිධාරීන් බිහි කරන පසුබිමක තවදුරටත් මෙම උපාධි පාඨමාලාව පැවත්වීම පිළිබඳ නැවත සලකා බැලිය යුතුව ඇත. |

| | | |
|---|---|---|
| බිහි කරන පසුබිමක තවදුරටත් මෙවැනි විශාල පිරිවැයක් දරමින් මෙම උපාධි පාඨමාලාව පැවත්වීම පිළිබඳව නැවත වරක් සලකා බැලිය යුතු කරුණක් බව විගණනයේ අදහසයි. | උපාධිධාරීන් සේ සලකා දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවක් ලෙස බඳවා ගන්නා නිලධාරීන් පිරිසක් ලෙස සැලකේ. | |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

| සේවා වර්ගය | අනුමත | තත්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 1144 | 934 | 210 | 0 |
| තෘතීයික | 83 | 21 | 62 | 0 |
| ද්විතික | 1222 | 980 | 242 | 0 |
| ප්‍රාථමික | 4891 | 3107 | 1784 | 0 |
| අනියම් | 0 | 0 | 0 | 0 |
| තාවකාලික (බහුකාර්ය) | 0 | 26 | 0 | 26 |
| කොන්ත්‍රාත් | 0 | 0 | 0 | 0 |
| එකතුව | 7340 | 5068 | 2298 | 26 |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමස්ත කාර්යය මණ්ඩල පුරප්පාඩු සියයට 31 ක් පැවතියද කෙටුම්පත් කාර්ය සාධන වාර්තාව අනුව වාර්ෂික මැනුම් ඉලක්කය සියයට 113 ප්‍රගතියක් ලබාගෙන ඇති බැවින් වාර්ෂික මැනුම් ඉලක්කයන් හා අනුමත කාර්ය මණ්ඩලය නැවත සංශෝධනය කළ යුතු බව විගණනයේදි නිරීක්ෂණය විය. | මෙම දෙපාර්තමේන්තුවට පුරප්පාඩු තනතුරු 2,298 ක් පවතින බැවින් තත්‍ය කාර්ය මණ්ඩලය තනතුරු 5,042කි. අනුමත සමස්ථ කාර්ය මණ්ඩලයට සාපේක්ෂව සියයට 31 කි. කාර්ය මණ්ඩලයේ කැපවීමෙන් අපේක්ෂිත වාර්ෂික මැනුම් ඉලක්ක අභිබවා සියයට 113 ක ප්‍රගතියක් වාර්තා කර ඇති බව නිරීක්ෂණය කරමි. ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස දැක්වීම සිදු කරනු ලබන්නේ මිනින්දෝරු සේවයේ හා සිතියම් තාක්ෂණ නිලධාරි වැනි ක්ෂේත්‍ර ගත රාජකාරි ඉටු කරන නිලධාරීන් සඳහා වේ. | පුරප්පාඩු තනතුරුවලට බඳවා ගැනීම හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර යුතු අතර වාර්ෂික මැනුම් ඉලක්කයන්ද සංශෝධනය කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ භූමිතික අංශයේ කාර්ය මණ්ඩල තොරතුරු අනුව අනුමත මැනුම් සහයකයින් ගණන 42 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 60 ක් විය. ඒ අනුව අතිරික්තය 18 ක් වූ අතර මෙම අතිරික්තය භූමිතික අංශයේ කාර්යයන් සඳහා යොදවා නොමැති බව තවදුරටත් නිරීක්ෂණය විය. | විගණන විමසුම මගින් පෙන්වා දී ඇති කරුණු නිවැරදිය. භූමිතික අංශය මගින් යොමුකර ඇති අංක 66/මැනුම්/2024 හා 2024 මාර්තු 26 දිනැති ලිපිය මගින් සිදුකර ඇති ඉල්ලීම පරිදි එම අංශය සඳහා මැනුම් ක්ෂේත්‍ර සහායකයින් 11 දෙනෙකු අනුයුක්ත කිරීමට උපදෙස් ලබා දෙන ලදි. | සේවක කාර්ය මණ්ඩලය නිවැරදිව අනුයුක්ත කළ යුතුය. |